මලික් සමරවික්‍රම FCMA
மலிக் சமரவிக்கிரம FCMA
MALIK SAMARAWICKRAMA FCMA
සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය
அபிவிருத்தி உபாய முறைகள் மற்றும் சர்வதேச வர்த்தக அமைச்சர்
MINISTER OF DEVELOPMENT STRATEGIES & INTERNATIONAL TRADE

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 18.10.2018

<u>මාධ්‍ය නිවේදනය</u>

**ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳව අමාත්‍ය මලික් සමරවික්‍රම විසින් ප්‍රකාශයක්**

ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂක මණ්ඩලයේ ක්‍රියාකලාපය පිළිබඳව ජනාධිපති ජනමාධ්‍ය මූලාශ්‍ර උපුටා දක්වමින්, ඊයේ සහ අද ඇතැම් මාධ්‍ය පලකල ප්‍රවෘත්ති වාර්තා වගකීමකින් තොරවේ. එම ප්‍රවෘත්ති වල පලවූ මෙම පදනම් විරහිත චෝදනා මා තරයේ ප්‍රතික්ෂේප කරමි. ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය අතිශය ගෞරවාන්විත වෘත්තිකයින්ගෙන් සැදුම් ලත්, පූර්ණ වගකීමකින් හා අවංකභාවයෙන් කටයුතු කළ බව මම ඉතා විශ්වාසයෙන් ප්‍රකාශ කරමි. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය අන්තර්ගත වූයේ ආයෝජන මණ්ඩලයට වෘත්තීයවේදීත්වය නැවත ගෙන ඒමට උත්සාහ කළ, රටේ ආයෝජන පහසුකම් සහ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් වලට මග පෙන්වන ලද ගෞරවනීය පුද්ගලයින්ගෙනි. මට ලැබී ඇති සියලුම වාර්තා වලින්, ආයතනයේ කාර්ය මණ්ඩලය මෙන්ම අව්‍යාජ ආයෝජකයින් ඔවුන්ගේ වෘත්තීමය ක්‍රියාවන් අගය කර ඇත. රජයේ ආයෝජන ප්‍රතිපත්ති සහ ආයෝජන මණ්ඩලයේ ප්‍රයත්නයන් නිසා, 2018 දී අනුමත කරන ලද ව්‍යාපෘතිවල වටිනාකම ඇමරිකානු ඩොලර් බිලියන 18 ඉක්මවයි. 2017 දී අනුමතවූ සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය ඩොලර් බිලියන 1.9 කි. එවැනි ප්‍රගතියක් අත්පත් කරගත් කාලයකදී මෙවැනි අසත්‍ය මාධ්‍ය ප්‍රකාශ මගින් ආයෝජකයන් නොමඟ යනු ඇත.

මලික් සමරවික්‍රම (පා.ම.)
සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය

කාර්යාලය / அலுவலகம் / Office 011-2395133/135/ 138
ෆැක්ස් / பெக்ஸ் / Fax 011-2395139/ 133
25 වන මහල, බටහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01, ශ්‍රී ලංකාව
25 வது மாடி, மேற்கு கோபுரம், உலக வர்த்தக மையம், கொழும்பு 1, இலங்கை
Level 25, West Tower, World Trade Centre, Colombo 01, Sri Lanka